කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
**Agricultural and Agrarian Insurance Board**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
Ministry of Agriculture, Livestock, Land and Irrigation

No.117, Subhadrarama Rd,
Gangodawila, Nugegoda

නො. 117, සුභද්‍රාරාම පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

இலக்கம் 117, சுபத்ராராம வீதி,
கங்கொடவில, நுகேகொட

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது, லக்கம்<br>My Ref. No. | AAIB/8/G/0077 | ඔබේ අංකය<br>உமது, லக்கம்<br>Your Ref. No. | ........................ | දිනය<br>திகதி<br>Date | 2026.10.06 |

**<u>පැරණි ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකවී සිටින විශ්‍රාම වැටුප්ලාභීන් වෙත ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප් ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.</u>**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය 1987 වර්ෂයේ ආරම්භ කරන ලද ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ගොවීන් 871,425ක් දායකත්වය ලබා ඇත.

මේ වන විට මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ දායකත්වය ලබා වයස අවුරුදු 60 සම්පූර්ණ කරන ලද ගොවි මහත්ම මහත්මීන් 170,950 ප්‍රමාණයකට තැපැල් කාර්යාල 3975 හරහා රුපියල් මිලියන 415 කට වැඩි මුදලක් විශ්‍රාම වැටුප් ලෙස මාසිකව ගෙවනු ලබයි.

මෙම යෝජනා ක්‍රමය යටතේ දායක වී 2014.01.01 දින සිට වයස අවුරුදු 60 සම්පූර්ණවී ගොවි විශ්‍රාම වැටුප් ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති ගොවීන්ගේ හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවා තිබුණි.

මේ සම්බන්ධයෙන් ගොවි මහතුන් විසින් ඉදිරිපත් කරන ලද දුක්ගැනවිලි පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරමින් එම වගකීම වර්තමාන රජය විසින් භාරගෙන එම හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇත.

ඒ අනුව මහා භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රතිපාදන වලට අනුව 2025 ජූනි, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් සහ 2026 අප්‍රේල්, මැයි මාස වලට අදාල හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම 2026 අගෝස්තු මාසයේ සිට ආරම්භ කර ඇත. මේ වන විට රු.මිලියන 38 කට ආසන්න ප්‍රමාණයක් ගොවීන් 2910 ට ප්‍රමාණයකට ගෙවා අවසන් කර ඇති අතර තවදුරටත් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකරනු ලැබේ.

පැවති රජයන් වෙත මේ සම්බන්ධයෙන් ගොවි ජනතාව විසින් විවිධ ඉල්ලීම් කරනු ලැබුවද කිසිදු පියවරක් නොගෙන ඇති අවස්ථාවක වර්තමාන රජය විසින් මේ සම්බන්ධයෙන් මැදිහත්වීම ගොවි ජනතාව ලැබූ විශේෂ ජයග්‍රහනයක් ලෙස සැලකිය හැකිවේ.

10/06

ජේමසිරි ජාසිංආරච්චි
සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
අංක. 117, සුභද්‍රාරාම පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

ජේමසිරි ජාසිංආරච්චි,
සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය


| | | සභාපති<br>தலைவர்<br>Chairman | අධ්‍යක්ෂ ජෙනරාල්<br>பணியாளர் நாயகம்<br>Director General | පොදු<br>பொது<br>General | ක්ෂණික ඇමතුම්<br>ஹாட்லைன் எண்<br>Hot Line: 1918 |
|---|---|---|---|---|---|
| විද්‍යුත් තැපැල மின்னஞ்சல் E-mail. | : | chairman@aib.gov.lk | dg@aib.gov.lk | aaibinfo@aib.gov.lk | |
| දුරකථන தொலைபேசி Telephone | : | 011-348 4861 | 011-348 4863 | 011-238 4000 | |
| ෆැක්ස් பெக்ஸ் Fax | : | 011-281 2573 | 011-281 2574 | 011-281 2573 | |
| වෙබ් අඩවිය இணையதளம் Website | : | aib.gov.lk | aib.gov.lk | aib.gov.lk | |